# පරිසරය පිළිබඳ
# සර්ව ආගමික ඉගැන්වීම්




මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය



## ආචාර්ය ෆරීනා රුසයික්

ඉගැන්වීම ඇතුළුව පරිසර ක්ෂේත්‍රයේ අවුරුදු විස්සකට වැඩි කාලයක් අත්දැකීම් ලබා ඇති අතර,
වර්තමානයේ කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සහායක කථිකාචාර්ය (1994 - 1999) භූගෝල අධ්‍යයන අංශය - කොළඹ විශ්වවිද්‍යාලය
ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරිනී (1999 - 2005) මධ්‍යම පරිසර අධිකාරිය
විද්‍යාවේදී උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) - වන විද්‍යාව සහ පරිසර කළමනාකරණය
ආචාර්ය උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය) - පරිසර භූගෝල විද්‍යාව
ලේකම් (2005 - 2019) - ශ්‍රී ලංකා භූගෝල විද්‍යාඥයන්ගේ සංගමය (SLAG)
ලේකම් (2019 සිට) - සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍ර පිළිබඳ ආචාර ධර්ම සමාලෝචන කමිටුව,
කලා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය (ERCSSH)
සාමාජික (2015 සිට) - අධ්‍යක්ෂ මණ්ඩලය, සංවර්ධන පර්යේෂණ හා
මැදිහත් වීම සඳහා මධ්‍යම මධ්‍යස්ථානය CDRI
පාරිසර භූගෝල විද්‍යාව, වෛද්‍ය භූගෝල විද්‍යාව,
තිරසාර සංචාරක සැලැස්ම සහ පරිසර දූෂණය වැළැක්වීම
පිළිබඳ පර්යේෂණ නිබන්ධන
රැසක් සහ පොත්පත් එළිදක්වා තිබේ.



## ආචාර්ය ෆරීනා රුසයික්

ඉගැන්වීම ඇතුළුව පරිසර ක්ෂේත්‍රයේ අවුරුදු විස්සකට වැඩි කාලයක් අත්දැකීම් ලබා ඇති අතර,
වර්තමානයේ කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සහායක කථිකාචාර්ය (1994 - 1999) භූගෝල අධ්‍යයන අංශය - කොළඹ විශ්වවිද්‍යාලය
ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරිනි (1999 - 2005) මධ්‍යම පරිසර අධිකාරිය
විද්‍යාවේදී උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) - වන විද්‍යාව සහ පරිසර කළමනාකරණය
ආචාර්ය උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය) - පරිසර භූගෝල විද්‍යාව
ලේකම් (2005 - 2019) - ශ්‍රී ලංකා භූගෝල විද්‍යාඥයන්ගේ සංගමය (SLAG)
ලේකම් (2019 සිට) - සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍ර පිළිබඳ ආචාර ධර්ම සමාලෝචන කමිටුව,
කලා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය (ERCSSH)
සාමාජික (2015 සිට) - අධ්‍යක්ෂ මණ්ඩලය, සංවර්ධන පර්යේෂණ හා
මැදිහත් වීම සඳහා මධ්‍යම මධ්‍යස්ථානය CDRI
පාරිසර භූගෝල විද්‍යාව, වෛද්‍ය භූගෝල විද්‍යාව,
තිරසාර සංචාරක සැලැස්ම සහ පරිසර දූෂණය වැළැක්වීම
පිළිබඳ පර්යේෂණ නිබන්ධන
රැසක් සහ පොත්පත් එළිදක්වා තිබේ.

# පරිසරය පිළිබඳ ඉස්ලාමයේ ප්‍රවේශය

**මැවීම් සහ ඒකදේවවාදය**
ඉස්ලාමය පරිසර අංගයන් සියල්ල අල්ලාහ් විසින් මවනු ලැබූ බව පැහැදිලි කරයි.

⇩

**මිනිසා සහ පරිසරය**
මිනිසා පරිසරය භාවිත කළ යුත්තේ කෙසේද යන්න පැහැදිලි කරයි.

⇩

**පරිසරය පිළිබඳ කාර්යභාරය හා පැවැත්ම**
පරිසරය පූර්ව සංරක්ෂණය කිරීම පිළිබඳ සැලකිල්ලට භාජනය කරමින් ඉස්ලාමයේ දේශනයන් හැඩ ගැසී ඇත.

⇩

**පරිසර සංරක්ෂණය සහ එහි පැවැත්ම**
ඉස්ලාමයේ සියලුම මඟ පෙන්වීම් පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා සම්බන්ධ වේ.

⇩

**දේවදූතයාණන්ගේ මඟ පෙන්වීම**
පරිසරය පිළිබඳව දේවදූතයාණන් විසින් දේශනා කොට එය සනාථ කර ඇත.

## 1. හැඳින්වීම

ඉස්ලාමය යනු පරිපූර්ණ වූ ධර්මයකි. එම නිසා ඉස්ලාමයේ මූලාශ්‍රයන් වන 'අල් කුර්ආනය' හා 'ඇල්හදීසය' මිනිසාගේ ජීවිතයේ සියලුම අංගයන් පිළිබඳව මඟ පෙන්වයි. ලෝකය මැවූ අවස්ථාවේ සිට ලෝක අවසානය තෙක් මෙම මඟ පෙන්වීම අදාළ වේ. ඒ අනුව විශ්වයේ සෑම අංගයක්ම බලසම්පන්න වූ දෙවි කෙනෙකු විසින් මවනු ලැබූ බව ඉස්ලාමය දේශනා කරයි. ඉස්ලාමය පවසන මිනිසාගේ ජීවිතය ස්වාභාවික පරිසරය හා බැඳී පවතී. මිනිසා ස්වභාව ධර්මයේ සෑම අංගයකම අවශ්‍යතාවයේ රඳා පවතින අතර, ඒ සෑම අංගයක්ම

අරමුණක් නොමැතිව අනවශ්‍ය ලෙස මවනු නොලැබූ බව ඉස්ලාමය පැහැදිලි කරයි. දේව වැකි වන පාරිශුද්ධ අල් කුර්ආනයේ බොහෝ තැන්වල මෙය පැහැදිලි කර ඇත.

මේ පිළිබඳව අප සොයා බැලීමට පෙර පාරිශුද්ධ වූ අල් කුර්ආනය ආධ්‍යාත්මික ග්‍රන්ථයක් යන්න සිතෙහි තබා ගැනීම ඉතා වැදගත් වේ. මිනිසුන්ව ඉස්ලාමය වෙත ආකර්ෂණය කර ගැනීමටත්, ඉස්ලාමයේ සත්‍ය බව ලෝකයට හඬ ගා කීමටත් දහසකට වැඩි සනාථ කිරීම් අල් කුර්ආනයේ සඳහන් වේ. එහි බොහොමයක් කරුණු විද්‍යාව හා බැඳුණු ඒවා වේ. එහි සඳහන් බොහෝ කරුණු අද නවීන විද්‍යාව විසින් සනාථ කොට ඇත.

- අහස් ද, මිහිතලය ද ඒ දෙක අතර ඇති දෑ ද අපි කෙළිලොල් කරන්නන් ලෙස නොමැව්වෙමු (සූරා අද් දුඛාන්; 44:38)
- "අපි සත්‍යය සඳහා මිස ඒ දෙක නොමැව්වෙමු. එනමුත් ඔවුන්ගෙන් බහුතරය (ඒ බව) නොදනිති. (සූරා අද් දුඛාන්; 44:39)
- "අහස ද මිහිතලය ද ඒ දෙක අතර ඇති දෑ ද නිෂ්ඵල දැයක් ලෙස අපි නොමැව්වෙමු. එය (නිෂ්ඵල යැයි සිතීම) ප්‍රතික්ෂේප කළවුන්ගේ අනුමානයයි. එබැවින් ප්‍රතික්ෂේප කළවුනට (හිමිවන්නේ නිරා) ගින්නෙන් වූ විනාශයයි. (සූරා අද් දුඛාන්; 38:27)

මෙම දේව වැකි සෑම මැවීමකම වැදගත්කම පිළිබිඹු කරයි. තව ද මෙම වැකි තුළින් විශ්වයේ සෑම මැවුමක්ම හේතුකාර සහිතව මවා ඇති බව පැහැදිලි වේ.

මිනිසා හා බැඳී පවතින පණ ඇති හා පණ නැති සෑම අංගයක්ම පරිසරය නම් වේ. මිනිසා සෘජු ලෙස හා වක්‍ර ලෙස මෙම පරිසරය මත රඳා පවතී. එම නිසා දෙවියන් විසින් අල් කුර්ආනයේ මිනිසාට ඉතා හොඳින් අවබෝධ කර ගැනීමට හැකි පරිදි අනතුරු අඟවමින්, අවවාද කරමින් සහ උනන්දු කරවමින් සිතීමට පොලඹවමින් පරිසරය උදාහරණයක් ලෙස ගෙන හැර දක්වා ඇත.

- තවද මෙනෙහි කරන්නට අපේක්ෂා කළවුනට ද කෘතඥ වීමට අපේක්ෂා කළවුනට ද රාත්‍රිය හා දහවල පරස්පරානු ගමනෙහි යන්නක් ලෙස ඇති කළේ ඔහුය. (සූරා අල් ෆුර්කාන්; 25:62)

## 2. පරිසරයේ ඇති දෙවියන්ගේ මැවීම්

අල්ලාහ් මිනිසා මැවීමට පෙර, ඔහුට අවශ්‍ය සියලු දෑ (පොළොව, ජලය, සුළඟ, ගින්දර, මුහුද, අහස, කඳු, වෘක්ෂලතා සහ ජීවීන්) ඔහු වෙනුවෙන්ම මවා ඇත. ඒවා නොමැතිව අපට ජීවත් විය නොහැක. මේවායෙහි වැදගත්කම

මිනිසා දැනගැනීම පිණිස අල් - කුර්ආනයේ බොහෝ තැන්වල මේ පිළිබඳව සඳහන් කොට ඇති අතර. අල් කුර්ආනයේ පරිච්ඡේද බොහොමයක් පරිසරයේ ඇති දෙවල් නමින් නම් කර ඇත. උදාහරණයක් වශයෙන් සූරා අල් - අන්ආම් (සතුන්), සූරා අල් අක්රාෆ් (කඳු මුදුන්), සූරා අර් - රහ්ද (ගිගිරුම්), සූරා අන් නහ්ල් (මී මැස්සෝ), සූරා අන් නමුල් (කුඹින්), සූරා අන් - කබූත් (මකුළුවෝ), සූරා අල් කහ්ෆ් (වැලිවැටිය), සූරා අත්තූර් (කන්ද), සූරා අල් ෆජ්ර් (අලුයම), සූරා අන් නජ්ම් (තාරකාව), සූරා අල් කමර් (චන්ද්‍රයා), සූරා අල් බුරූජ් (තාරකා මණ්ඩලය), සූරා අෂ්ෂම්ස් (සූර්යයා), සූරා අල්ලෙල් (රාත්‍රිය), සූරා අල් ලුහා (පෙරවරුව), සූරා අල් ෆීල් (ඇතා), සූරා අල් ෆලක් (අරුණෝදය), සූරා අන් - නාස් (මිනිස්සු) යනාදිය සඳහන් කළ හැක.

- නුඹලා වෙනුවෙන් මිහිතලය මත ඇති සියලු දෑ මැව්වේ ඔහුමය. ඉන් පසුව අහස දෙසට යොමු වී ඒවා අහස් සතක් ලෙස නිර්මාණය කළේය. ඔහු සියලු දෑ පිළිබඳව සර්වඥය (සූරා අල් බකරා ; 2:29)

මේ අනුව අප වටා ඇති මැවීම් පිළිබඳව අල්ලාහ් සඳහන් කරන්නේ කෙසේ දැයි අල් කුර්ආනයේ බොහෝ වැකි තුළින් දැනගත හැක.

## 2.1 පොළොව මතුපිට ඇති දෙවියන්ගේ මැවීම්

පොළොව මතුපිට මවා ඇති ආකාරය ද වෙනත් මැවීම් පිළිබඳව ද අල්ලාහ් අල් කුර්ආනයේ පහත ලෙස සඳහන් කරයි.

- "ඔහු කවරෙකු ද යත් අහස් හි හා මිහිතලයේ ආධිපත්‍යය ඔහු සතුය. ඔහු පුතෙකු (දාව) නොගත්තෙකුය. ආධිපත්‍යයෙහි ඔහුට හවුල්කරුවෙකු නොවීය. සෑම දෙයක්ම මවා පසුව එය සැලැස්මක් සහිතව (මනා ලෙස) සැකසුවෙකුය. (සූරා අල් ෆුර්කාන්; 25:02)
- "තවද මිහිතලය, අපි එය එළා එහි කඳු ස්ථිර ලෙස පිහිටෙව්වෙමු (දැය ඔවුන් නොබැලුවෝද?) තවද සියලු අලංකාර වර්ගයෙන් (යුත් දෑ) එහි අපි හට ගැන්වූයෙමු." (සූරා කාෆ්; 50:07)

මෙම වාක්‍යයන් මඟින් සනාථ කෙරෙන්නේ, පොළොව මතුපිට ඇති සියලුම දේ සර්වබලධාරී දෙවියන් විසින් මවනු ලැබූ දායාදයන් යන්නය. එම නිසා ඒවා හොඳින් භාවිත කොට ආරක්ෂා කිරීම මිනිසාගේ යුතුකම වේ. ඒ අනුව පොළොවේ භෞතික අංගයන් පිළිබඳ අල් කුර්ආනයේ සඳහන් වන දෑ පුළුල් ලෙස බලමු.

### I. පොළොව

දහසය වන සියවස තෙක් පොළොව සමතලා භූමියක් යැයි බොහෝ අය සිතූහ. නමුත්, යුරෝපීය පුනරුදය කාලයේ දී විවිධ අරමුණු සඳහා අලුත්